## මැතිවරණය , ජාතිකත්වය හා භික්ෂු දේශපාලනය

1956 මැතිවරණය පවත්වා අවුරුදු හතළිස් අටකට පසුව මෙවර පැවැත්වීමට නියමිත මැතිවරණය පනස්හයේ දරුවන්ගේ මැතිවරණය වෙයි. 1956 මැතිවරණය පැවැත්වුයේ ද අප්‍රියෙල් මාසයක ය. එවර මැතිවරණය දින තුනක් පුරා පැවැත්විණි. එ මැතිවරණයෙන් අවුරුදු පහළොවකට පසු 1971 අප්‍රියෙල් මස 5 වැනි දා (1956 මැතිවරණයේ පළමු දිනය වුයේ අප්‍රියෙල් 5 වැනි දින යැයි සිතමි.) පනස්හයේ දරුවන්ගෙන් සමහරෙක් පනස්හයේ තවත් දරුවන් පිරිසකට හා ඔවුන්ගේ දෙමව්පියන්ට එරෙහිව අවි ගත්හ. (අප පනස්හයේ දරුවන් යැයි කියන්නේ ජ වි පෙට පමණක් නොවේ.) එදා සිට අද දක්වා අවුරුදු තිස් තුනක් ගෙවී ඇත. අප රට ඩොමීනියන් නිදහස දිනාගත් 1948 සිට 1971 දක්වා අවුරුදු විසි තුනකි. 1971 සිට දේශපාලන බලය එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට මාරු වූ 1994 දක්වා කාලය ද අවුරුදු විසි තුනකි. දේශපාලනය මෙවැනි සංඛ්‍යා හරඹයක් නොවන බව පෙන්වා දීමට දේශපාලන විද්‍යාඥයෙක් අවශ්‍ය නොවේ. එහෙත් මේ සංඛ්‍යාවලින් කියැවෙන්නේ ඒ ඒ දේශපාලන ව්‍යාපාර විකාශය වී පරිණතවන ආකාරය ය.

1994 දී ද අප්‍රියෙල් මාසයේ නොවුවත් මැතිවරණයක් පැවැත්විණි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අගමැතිනිය වුයේ ඒ මැතිවරණයෙනි. එදා සිට අද දක්වා ගෙවී ගොස් ඇති අවුරුදු දහයක කාල පරිච්ඡේදයෙහි මෙරට සිදු වී ඇති වෙනස බොහෝ දෙනකුට තේරුම් ගැනීම අපහසු වී ඇත. එයට හේතුව සිදු වෙමින් පවතින්නේ කුමක් ද යන්න පිළිබඳ ව බටහිර දේශපාලන විද්‍යා න්‍යාය මගින් තේරුම් කර දීමට නොහැකි වීම ය.

1956 දී පිහිටුවන ලද සන්ධානය හෙවත් සඟ, වෙද, ගුරු, ගොවි කම්කරු බලවේගය හෙවත් ජාතික බලවේගය ඒ වසරේ පවත්වන ලද මැතිවරණයෙන් විශිෂ්ට ජයක් අත්පත් කර ගත්තේ ය. ජනතාව ඒ ආණ්ඩුවට අපේ ආණ්ඩුව යැයි කීවෝ ය. එහෙත් වැඩිකල් නොගෙස් ම ඒ ආණ්ඩුව කඩා වැටුණේ ය. පනස්හයේ දරුවෝ තමන් වැඩෙන වයසේ දී විවිධ පැතිවල යෑමට පටන්ගත්හ. 1971, 1986, 1994 ඒ ගමන් මාර්ගවල සංකේත වෙයි. 2004 දී ඔවුහු එකට එකතු වුහ. ඔවුන් දිගින් දිගට ම එකට සිටින බවක් ඉන් ගම්‍ය නොවේ. එහෙත් මෙරට දේශපාලනයේ ගමන් මග තීරණාත්මක ව ජාතිකත්වය පැත්තට යොමු වී ඇත.

1948 සිට 1956 දක්වා මෙරට පැවතියේ විජාතික බලවේගවල නියෝජිත ආණ්ඩුවකි. ඉන්පසු 1956 සිට 1965 දක්වා සමස්තයක් ලෙස ගතහොත් ජාතිකත්වයේ ආණ්ඩුවක් ඇති විය. ඉන් පසු 1965 සිට 1970 දක්වා පැවතියේ ඩඩ්ලි සේනානායක ආණ්ඩුව ය. 1970 සිට 1977 දක්වා සමගි පෙරමුණු ආණ්ඩුවක් විය. 1977 සිට 1994 දක්වා ම පැවතියේ විජාතික බලවේගවල ආණ්ඩුවකි. 1994 සිට 2001 දක්වා පොදු පෙරමුණු ආණ්ඩුවක් විය. 2001 සිට 2004 දක්වා නැවතත් විජාතික බලවේගවල ආණ්ඩුවක් ඇති විණි. මෙවර විජාතික බලවේගවල ආණ්ඩුවට පැවතිය හැකි වුයේ අවුරුදු තුනකට අඩු කාලයකි.

1994 මෙරට දේශපාලනයේ සන්ධිස්ථානයක් විය. ඒ වසරේ පැවති මැතිවරණයේ දී එ ජා පක්ෂයට වඩා චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නායකත්වය දුන් පොදු පෙරමුණ විජාතික බලවේගවල නියෝජිතයා විය. 1992 පමණ ඇය එංගලන්තයේ සිට මෙරටට ගෙන්වා ගනු ලැබුයේ විජාතික බලවේග විසිනි. එදා ඇය ගෙන්වා ගැනීමට මුල් වූ බොහෝ දෙනෙක් අද එ ජා ප සාමාජිකයෝ ය. නැත්නම් ආධාරකරුවෝ ය. එදා දෙමළ ජාතිවාදය ඇය පසුපස විය. සාම්ප්‍රදායික ව එ ජා පක්ෂයට හිතවත් පල්ලියේ නායක පුජකවරු එදා චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට පක්ෂපාත වුහ. ජාතිකත්වයේ ආධාරකරුවෝ කුමාරතුංග මහත්මිය බණ්ඩාරනායක කෙනකු යැයි වරදවා තේරුම් ගත්හ. ඇය ඒ වන විට දේශපාලන අරුතකින් ද කුමාරතුංග කෙනෙක් වුවා ය. 1994 යනු මෑත ඉතිහාසයේ ජාතිකත්වයේ ඉතාම දුර්වල අවස්ථාව විය. අවුරුදු 17ක් රට පාලනය කළ ජේ ආර් ජයවර්ධන ජාතිකත්වය නැති කිරීමට මුල් පියවර ගෙන තිබුණි. ජාතිකත්වයට එරෙහි දර්ශන, මතිමතාන්තර ලැව් ගින්නක් සේ පැතිර ගියේ ය. ජ වි පෙ එදා ජාතිකත්වය සමග නොවී ය. අවස්ථාවාදය තම දේශපාලනය කරගත් ජනතා මිතුරෝ කණ්ඩායම ජාතිය මළකඳක් ලෙස සලකමින් පොදු පෙරමුණට සහාය දුන්නේ ය. මේ ඉතාමත් ම අමාරු අවස්ථාවේ ජාතිකත්වයේ ධජය ඔසවාගෙන ගියේ දේශපාලන පක්ෂ ලෙස ගතහොත් මහජන එක්සත් පෙරමුණ හා භූමි පුත්‍ර පක්ෂය පමණ ය. ඒ අවුරුද්දේ දී ම එ පෙ

© Prof. Nalin De Silva

ඉතා දැඩිව ජාතිකත්වය වෙනුවෙන් පෙනී සිටියේ ය. එ තීරණාත්මක අවස්ථාවේ දී පසුව සිහල උරුමය පක්ෂයේ නායකයා වූ එස්. එල්. ගුණසේකර මහතා ම එ පෙ මැතිවරණ ව්‍යාපාරයෙහි විශේෂයෙන් ම කළුතර දිස්ත්‍රික්කයෙහි කැපී පෙනෙන කථිකයෙක් විය. එදා ම එ පෙ සමග සිටි වෙනත් අය අතර පූජ්‍ය බෙංගමුවේ නාලක හිමියෝ ද, පී අයි ඕ ධර්මසේකර මහතා ද (දැන් අනගාරික ධර්මසේකර තුමා), ගුණදාස අමරසේකර මහතා ද වූහ.

එදා පොදු පෙරමුණට විශිෂ්ට ජයක් අත්විණි. ම එ පෙ එදා ඉල්ලා සිටියේ පාර්ලිමේන්තුව තුළ පොදු පෙරමුණ හැසිරවීම සඳහා බලයක් පමණකි. එහෙත් මහජනයාට එදා එය නොතේරිණි. මහජනතාව ම එ පෙ පරාජය කෙළේ ය. 1977 දී මෙරට විජාතික බලවේග ආරම්භ කළ ක්‍රියාදාමය කුමාරතුංග මහත්මියගේ නායකත්වයෙන් ශ්‍රී ල නි ප මගින් ඉදිරියට ගෙනයෑම එ බලවේගවල අවශ්‍යතාවය විය. ප්‍රධාන වශයෙන්ම ඔවුන්ට අවශ්‍ය වුයේ කුමාරතුංග මහත්මිය නායකත්වය දරණ ශ්‍රී ල නි පක්ෂය මගින් දෙමළ ජාතිවාදයට උතුරු හා නැගෙනහිර පළාත් ලබාදීම ය. 1977 සිට ආර්ථික ක්ෂෙත්‍රයෙහි ලෝක බැංකුව ආදී බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදී ආයතන රටට විශාල වශයෙන් බලපෑම් කෙළේ ය. ඊනියා විවෘත ආර්ථිකයක් මගින් ලෝකයේ කිසිම රටක නොමැති විවෘත මංකොල්ලයක් කිරීමට විදේශිකයන්ට රට විවෘත කෙරිණි. රටේ කෘෂි ආර්ථිකය නැති කර දැමීමට අවශ්‍ය පසුබිම සකස් කෙරිණි. දේශීය නිෂ්පාදනවලට බාධා පමුණුවන ලදී. ඊනියා පුද්ගලිකකරණය නමින් ජාතික සම්පත් විකිණීම ආරම්භ කෙරිණි. මෙරට ආර්ථිකය විවිධාර්ථවලින් ණය ආර්ථිකයක් බවට පත්කෙරිණි. බටහිරයන් ලබා දෙන ණය , කොමිස් හා වෙනත් ක්‍රම ඔස්සේ ප්‍රධාන වශයෙන් කිහිප දෙනකු අත බෙදී යෑමත් ඉන් කොටසක් රටට කාන්දුවීමට ඉඩ හැරීමත් රටේ ආර්ථික ප්‍රතිපත්තිය විය. ණය ලබාගැනීමට හැකි වීම මුදල් ඇමතිවරයකුගෙන් බලාපොරොත්තු වූ එකම කාර්යය විය. එහෙත් එ සඳහා මුදල් ඇමති දක්ෂයකු වීම අනිවාර්ය නොවී ය. ආර්ථික ප්‍රතිපත්තිය ණය ආර්ථිකය ලෙස පවතිනතාක් ණය ගැනීම අපහසු නොවීය. පී .එල්. පීරිස් වැනි අයකුට වුව ද ණය ගැනීම අපහසු නොවී ය.

දේශපාලන වශයෙන් ජේ ආර් ජයවර්ධන බටහිර රටවල නිවට ගැත්තකු වී එ අනුව රට ද බටහිර තානාපතිවරුන් විසින් පාලනය කෙරෙන තත්ත්වයකට පත් කෙළේ ය. බටහිරයන්ගේ අවශ්‍යතාවය පරිදි දෙමළ ජාතිවාදයට රට පාවා දීමේ ක්‍රියාදාමය ආරම්භ කෙළේ ඔහු ය. බටහිරයන් විසින් ම පුහුණු කරනු ලැබූ කුමාරතුංග මහත්මියට තිබුණේ එ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑම ය. බටහිර තානාපතිවරු පමණක් නොව බටහිරින් මෙරටට එන කසිකබල් ජනමාධ්‍යකරුවෝ ද මෙරට දේශපාලන ප්‍රශ්නවල දී සෘජුව ම මැදිහත් වූහ. සිංහලයන් මෙරට දේශපාලනයෙහි හුදු නරඹන්නන් පිරිසක් බවට පත්කිරීම නව දේශපාලන ප්‍රතිපත්තිය විය. ජේ ආර් ගේ නරුම දීන බටහිර ගැති ප්‍රතිපත්තිවල ඵලය වුයේ ඉන්දියාව වැඩි වැඩියෙන් මෙරට දේශපාලනයට බල පෑම් කිරීම ය. ඉන්දියාව මුල දී කොටි සංවිධානය හදා වඩා ගත්තේ ජේ ආර් ආණ්ඩුවට විරුද්ධව ය. ජේ ආර් ට අවසානයේ දී බටහිර තානාපතිවරුන්ට ගැතිකම් කරනු මදිවාට ඩික්සිත්ගේ දේශපාලන අවශ්‍යතා අනුව කටයුතු කිරීමට ද සිදු විය. එ සියල්ල අවසන් වුයේ ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමෙනි.

සංස්කෘතික ව ගත්කල බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදය තම ප්‍රතිපත්ති නිරුවත්ව ම ක්‍රියාත්මක කෙළේ ය. දේශපාලන වශයෙන් මැදිහත්වන රාජ්‍ය නොවන සංවිධාන පමණක් නොව බටහිර සංස්කෘතික ප්‍රතිපත්තිය ඉතා ගොරහැඩිව ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන ද මෙරට ඇති විය. බටහිර කුණුකන්දල් මතවාද සියල්ල වෙනුවෙන් මෙරට එ එ නියෝජිතයෝ පත්කරනු ලැබූහ. ඇමරිකන් ක්‍රිස්තියානි ආගම් මෙරට ප්‍රචාරය කරන වරල්ඩ් විෂන් වැනි සමාගම් මෙරට බිහිවිණි. පාස්ටර්වරු වැසිකාලවල කුඩැල්ලන් මෙන් රටේ අස්සක් මුල්ලක් නැර දැකගත හැකි විය. සිරස වැනි ජනමාධ්‍ය ඇති කර මෙරට සංස්කෘතිය දියකර හැරීමේ ක්‍රියාදාමයට ජනමාධ්‍ය දායකත්වය ද ඇති කෙරිණි. රටක සංස්කෘතියක් නැති කිරීම යනු එ රට පරාධීන කිරීම බව ඇංකරයන්ට අමතක කරවා ඇති කරුණකි. වැලන්ටයින් පමණක් නොව ඔහුගේ බාප්පලා ද මෙරටට ආනයනය කෙරිණි.

ඉහත සඳහන් වනුයේ 1977න් ඇරඹී 2004 දක්වා ම මෙරට සිදු වූ සිදුවන ක්‍රියාදාමයේ ඉතා දළ සාරාංශයක් පමණකි. එහෙත් මේ ක්‍රියාදාමයේ නරක ම කොටස පසු වී අවසන් ය. 1995න් පමණ පසුව එ ක්‍රියාදාමය අවරට යමින් පවතියි. වෙනත් ආකාරයකින් කියන්නේ නම් 1995 එ ක්‍රියාදාමයෙහි හැරුම් ලක්ෂ්‍යය විය. පොදු පෙරමුණ ඊනියා පැකේජය ගෙන එමෙන් පසුව ජාතිකත්ව මතවාද දෙස සිංහලයෝ ක්‍රමයෙන් බලන්නට වූහ. ජාතික එකාබද්ධ කමිටුව, සිංහල කොමිසම ආදිය පිහිටවනු ලැබුයේ මෙකල ය. එහෙත් ජාතිකත්වය වේගයෙන් ඉදිරියට නොගියේ ය. තම

© Prof. Nalin De Silva

දේශපාලනය ඉල්ලුම හා සැපයුම කරගත් පිරිස ජාතිකත්වයට ඉල්ලුමක් ඇතැයි කියමින් නැවතත් ජාතික ව්‍යාපාරයට එකතු වූහ. එහෙත් එකතු වූ දින සිට ම ජාතික ව්‍යාපාරය බිඳදැමීමට, කෙටවීමට ක්‍රියා කළහ. ඒ කුඩුකේඩුකම් සියල්ල තිබිය දී පැකේජය පරාජයට පත්විණි. වැඩිකල් නොගොස් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව බලයට පත්වූයේ ය. එහෙත් ඔවුන් බලයට පත්වූයේ ඔවුන්ගේ අවර යුගයෙහි ය. එය ඉතා දුර්වල ආණ්ඩුවක් විය. එය කෙතරම් දුර්වල වී ද යතහොත් මෙරට ආණ්ඩුවක් ඇත්තේ සියඹලාන්ඩුවේ පමණක් යැයි කීමට වරක් දිනේෂ් ගුණවර්ධන මහතාට සිදු විය. මෙරට ජාතික බලවේගවලට ක්‍රියාත්මක වීමට තිබූ අමාරුම අවධිය අපි පසු කර ඇත්තෙමු. කලක් ජාතිකත්වය වෙනුවෙන් පෙනී සිටියේ කිහිප දෙනකු පමණක් වුව ද අද විවිධ සංවිධාන හා පුද්ගලයන් ඒ වෙනුවෙන් පෙනී සිටිනු දැකීමට ලැබීම සතුටට කරුණකි. එහෙත් මෙවැනි අවස්ථාවල දී සාමාන්‍යයෙන් වන පරිදි ම පුරෝගාමීන් සමහරකු අමතක කිරීම ද සිදුවනු දක්නට ලැබෙයි.

බටහිර මතවාද අතනින් මෙතනින් අහුලාගත් ඊනියා ප්‍රබුද්ධයන් කියන්නේ, සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් තමන් හා තම සංස්කෘතිය නැති කිරීමට විදේශිකයන් කුමන්ත්‍රණය කරන්නේ යැයි සිතන බව ය. එක් කසිකබල් ප්‍රබුද්ධයකුට අනුව මා ද සිතන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් සිංහලයන් නැති කිරීම සඳහා කුමන්ත්‍රණය කරන බව ය. ඊනියා බුද්ධිමතුන් ලෙස පෙනී සිටිය ද සංකල්පීය ව සිතීමට නොහැකි මොවුන්ට පසුගිය අවුරුදු දහඅටක පමණ කාලයක් මුළුල්ලේ අප විසින් නිර්මාණය කෙරී ඇති නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය පිළිබඳ ව හෝ වෙනත් ප්‍රවාද පිළිබඳ ව හෝ ඇතැම් පාසල් සිසුන්ට ඇති අවබෝධය නොමැත. මෙරට සිදුවන කුමන්ත්‍රණයක් නැත. මෙරට ඇත්තේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය පමණකි. එය කුමන්ත්‍රණයක් නොවේ. එය ප්‍රසිද්ධ කරුණකි. මේ යටත්විජිතවාදය තම ප්‍රධාන අපේක්ෂා ඉටු කර ගැනීම සඳහා අනු ව්‍යාපෘතිවල දී කුමන්ත්‍රණකරනවා විය හැකි ය. උදාහරණයක් වශයෙන් ගතහොත් යම් පුද්ගලයකු ශාරීරික ව හෝ ආධ්‍යාත්මික ව හෝ විනාශ කිරීම සඳහා කුමන්ත්‍රණ සිදු කෙරෙනවා විය හැකි ය. එහෙත් සිංහල ජාතිය විනාශ කිරීම සඳහා කුමන්ත්‍රණයක් නැත. ඇත්තේ මෙරට බටහිර ක්‍රිස්තියානි දේශපාලන, ආර්ථික හා සංස්කෘතික යටත්විජිතවාදය ක්‍රියාත්මක කිරීමේ වෑයම, රාජ්‍ය නොවන සංවිධානවල කසිකබල් ප්‍රබුද්ධයන්ට අනුව නම් ව්‍යාපෘතිය, පමණකි. මෙය මෙරටට පමණක් සීමාවූවක් ද නොවේ. එය මුළු ලෝකය පුරාම බුද්ධ වර්ෂ විසිවැනි සියවසේ පමණ සිට ක්‍රියාත්මක වෙයි. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ අවශ්‍යතාවය මුළු ලෝකය පුරා ම තම දේශපාලනය. ආර්ථිකය හා සංස්කෘතිය ව්‍යාප්ත කිරීම ය.

කෙසේවෙතත් 1992 දී පමණ කුමාරතුංග මහත්මිය මගින් පීලි පන්නනු ලැබූ ශ්‍රී ල නි පක්ෂය අද නැවතත් සිංහලත්වයේ මගට එමින් ඇත. මේ ලිපියේ මුල සඳහන් කෙරී ඇත්තේ පසුගිය කාලයේ ඉතා අමාරුවෙන් සිදු කෙරුණු මේ කාර්යය පිළිබඳ ව ය.  එහෙත් එය තව ම ආරම්භ වූවා පමණකි. ශ්‍රී ල නි පක්ෂය ජාතිකත්වයේ මගට ගැනීම පළල් ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. එහි දී විවිධ පුද්ගලයෝ, පක්ෂ හා සංවිධාන විශේෂිත කාර්යභාර ඉටුකරති. ඉතා ම අඩු ශක්තියක් ඇති ජාතික සංවිධානයක් වුව ද එහි දී යම් කර්තව්‍යයක් ඉෂ්ට කරයි. එහෙත් කුමාරතුංග මහත්මිය එක පිම්මේ ජාතිකත්වයේ මතයට පැමිණේ යැයි කිසිවකු බලාපොරොත්තු තබා නොගත යුතු ය. ඇය නව සන්ධානයට විවිධ පක්ෂ ගෙන එමෙන් සංධානය අවිචාරුවක් කිරීමට කටයුතු කරනු ඇත. ඇය කිසිම දිනක ජාතිකත්වය වැළඳ නොගැනීමට ඇති ඉඩ කඩ (සම්භාවිතාව) ඉතා අධික ය. එහෙත් අපට එය ප්‍රශ්නයක් නොවේ. අප බලන්නේ ශ්‍රී ල නි පක්ෂයේ හා ජාතිකත්වයේ සමස්ත ගමන්මග දෙස මිස පුද්ගලයන්ගේ ගමන්මග ගැන නොවේ. අපි ඔවුන් අධ්‍යයනය කරමු. ඔවුන් කරන්නේ කුමක් ද යන්න ගැන අපට වැටහීමක් ඇත. අවාසනාවකට ඔවුන් අත්හැර යෑමට ද අපට නොහැකි ය.

1995න්, විශේෂයෙන් ම 2001න්, පසුව  විජාතික බලවේග එහි අවරට යෑම නිසා ම යටත්විජිතවාදී ක්‍රියාදාමය වඩා වේගවත්ව ගලා යෑමට පටන් ගත්තේ ය. කොළඹ මාසයකට වඩා කෙරෙන නත්තල් සැරසිලි, වැලන්ටයින් දින පැවැත්වීම්, රූපවාහිනිය ගංගනාථකරණය කිරීම, මෙරට ජාතිකත්වයට එරෙහි කලා කෘතිවලට හා එහි නිර්මාතෘවරුන්ට විවිධ ආයතන මගින් ත්‍යාග ලබා දීම, ඇමරිකන් මුදලින් ක්‍රිස්තියානිය ව්‍යාප්ත කිරීම, රාජ්‍ය දේපොළ විකිණීම ආදිය එයට උදාහරණ වෙයි. අද මේ ක්‍රියා තරමක් මෙල්ල කෙරී ඇත. මෙවර වැලන්ටයින්ට එතරම් සුබ නොවී ය. දෙමළ ජාතිවාදයට රට පාවාදීම සඳහා ඇතිකර ගත් ඊනියා අවබෝධතා ගිවිසුම මෙහි ම තවත් පැත්තක් පමණකි. මේ සමස්තය දැකිය හැකි ප්‍රවාද දැන් අප සතුවෙයි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සිදු

© Prof. Nalin De Silva

වුයේ මේ යටත්විජිතවාදී ක්‍රියාදාමය නැවැත්වීමට ය. ඒ ක්‍රියාදාමය නැවැත්වීම සඳහා පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ම ජාතිකත්වයේ ජයග්‍රහණයකි. එයට විරුද්ධව බටහිර රටවල තානාපතිවරු බලපෑම් ඇති කළහ. බීබීසී නම් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ ප්‍රචාරක ආයතනයේ ලංකා නියෝජිතයා (අගු පිලේ සිටින සංදේශයේ නියෝජිතයා නොවේ) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට විරුද්ධ මතවාද යටත්විජිතවාදී හොරණෑව මගින් ලෝකය පුරා විසුරුවා හරියි. කුමාරතුංග මහත්මියට ජාතිකත්වයේ මතයට කන් දී පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට සිදුවූයේ මේ බලපෑම් මධ්‍යයේ ය. එය ම ජාතිකත්වයේ ජයග්‍රහණයකි. එහෙත් එය ප්‍රමාණවත් නොවේ.

ජාතිකත්වය තව තවත් ජයග්‍රහණය කරා මෙහෙයවනු වෙනුවට එය කඩාකප්පල් කිරීමට දරන වෑයමක් ද වෙයි. සෝම හාමුදුරුවන් ජාතික ව්‍යාපාරයට එකතු වූයේ ද එහි නව නැම්මක් ඇති වීමෙන් පසු යුගයේ දී ය. උන්වහන්සේ බුද්ධිවාදී ස්ථාවරයක් මුල දී දැරුව ද ක්‍රමයෙන් ජාතික මතවාද දෙසට නැඹුරු වෙමින් පැවතිණි. එහෙත් කිසියම් හේතුවකින් (සමහර විට එය නම් කුමන්ත්‍රණයක් විය හැකිය) උන්වහන්සේ සෘජු දේශපාලනයට අවතීර්ණ වූහ. උන්වහන්සේ ජනාධිපතිවරණයට ඉදිරිපත්වන බව ප්‍රකාශ විය. මෙරට භික්ෂුන් වහන්සේලාගේ කාර්යභාරය ඇතැමුන්ට එක්කෝ නොතේරෙයි. නැත්නම් ඔවුහු වංකව භික්ෂුන්වහන්සේලා තම දේශපාලන වුවමනාවන් ඉටුකර ගැනීම සඳහා යොදා ගනිති. අතීතයේ සිට සිංහල බුද්ධාගමේ භික්ෂුන් වහන්සේ රාජ්‍යපාලනයෙහිලා සෘජුව සහභාගි නොවූ බව අපි මෙයට කලින් ලිපිවලින් ද පෙන්වා දුන්නෙමු. උන්වහන්සේ ඉරානයේ කුමේනිලා මෙන් රට පාලනය නොකළහ. උන්වහන්සේ අඩුම තරමින් පැරණි භාරතයේ බ්‍රාහ්මණයන් මෙන් රාජසභාවේ පුරෝහිතකම් ද නොකළහ. උන්වහන්සේ රජුන්ට අවවාද අනුශාසනා කළහ. ඇතැම් විට රජුන් පත්කර ගැනීමේ දී උපදෙස් දුන්හ. එහෙත් සිවුරු දරමින් රාජ්‍යපාලනයෙහි නොයෙදුණහ. රජවීමට නම් සිවුරු හැර උපැවිදිවීමට සිදු විය. ධාතුසේන කුමරු කලක් පැවිදිව සිටි නමුදු රජ වූයේ භික්ෂුන්වහන්සේ කෙනකු ලෙස නොවේ. සෙනරත් කුමරු ද එසේ උපැවිදි වී රජ කෙළේ ය. භික්ෂුන්වහන්සේගේ මේ ක්‍රියාකලාපයට බටහිර තකතීරු සමාජ විද්‍යාඥයෝ වුවමනාවෙන් වැරදි අර්ථකථන දෙති. ඔවුන් නිතර කියන්නේ භික්ෂුන්වහන්සේ රජුන්ගේ භූමිකාව කළ බව ය. මෙසේ කියන්නන් අතර සිංහල සමාජය දෙස වෛරයෙන් බලන සිංහල වූ බටහිර සමාජ විද්‍යාඥයෝ ද වෙති. ඇතැම්විට මේ වැරදි අර්ථවිවරණ නිසාම දෝ ඇතැම් භික්ෂුන්වහන්සේට දේශපාලන බිමෙහි තරගකිරීමට පෙළෙඹී සිටිති. එහෙත් සිංහල බෞද්ධයෝ පොදුවේ ගත්කල භික්ෂුන්වහන්සේ එසේ සෘජුව දේශපාලනය කිරීම අනුමත නොකරති. සෝම හාමුදුරුවන් ජනාධිපතිවරනයට ඉදිරිපත් වීමේ අදහස ප්‍රකාශ කළ දින සිට උන්වහන්සේගේ ජනප්‍රියතාවය අඩුවිය.

1994 සිට අද දක්වා ජාතික ව්‍යාපාරය ඉතා දුෂ්කර ගමනක යෙදී සුළු ජයග්‍රහණයක් අත්පත් කරගත්තා පමණ ය. ජාතික ව්‍යාපාරයට කෙටි ගමන්මග නැත. ජාතික ව්‍යාපාරයට අවශ්‍ය අද යුදෙව් ක්‍රිස්තියානි මතවාදවල ගිලී ඇති දේශපාලන පක්ෂ ක්‍රමයෙන් ජාතික මතවාදවලට ගෙන ඒම ය. අපට දේශපාලනයෙන් මිදීමට නොහැකි බව සැබෑ ය. ඕනෑම සංවිධිත සමාජයක දේශපාලනයක් ඇත. කුඩා සමිතියක වුව ද දේශපාලනයක් ඇත. මෙහි දී දේශපාලනය යන වචනය යොදා ගැනෙන්නේ පළල් අරුතකිනි. රටේ පාලනය සම්බන්ධයෙන් ගත්කල රාජ්‍ය දේශපාලනය වෙයි. අද අප මත බටහිරයන් පක්ෂ දේශපාලනය පටවා ඇත. එය අපට සුදුසු නොවේ. දේශපාලනයෙන් මිදීමට නොහැකි බැවින් ද වෙනත් දේශපාලනයක් දැනට නැති බැවින් ද අපට පක්ෂ දේශපාලනයෙහි යෙදීමට සිදු වී ඇත. එහෙත් මෙයින් කියැවෙන්නේ භික්ෂුන් වහන්සේ පක්ෂ දේශපාලනයෙහි යෙදිය යුතු බව නොවේ. ඉල්ලුම සැපයුම දේශපාලනයේ යෙදෙන්නන්ට සෝම හිමියන්ගේ අපවත්වීමෙන් පසුව ඉල්ලුමක් ඇති වී තිබේ. ඒ ඉල්ලුම වෙනුවෙන් මැතිවරණයට භික්ෂුන්වහන්සේ සැපයීමට ඔවුහු සූදානම් වෙති. භික්ෂුන්වහන්සේ එලෙස පක්ෂ දේශපාලන බිමට එනු ඇත්තේ ගිහියන් නායකත්වය දරණ, ලේකම් ධුරය දරණ දේශපාලන පක්ෂවලින් ය. මෙය භික්ෂුත්වයට කැළලකි. සමසමාජ පක්ෂයට හා බද්දේගම සමිත හිමිට එය සුදුසු විය හැකි ය. එහෙත් ජාතිකත්වයේ පක්ෂවලට හා ජාතිකත්වයේ භික්ෂුන්වහන්සේට පක්ෂ ලේකම්ගේ අණට කීකරුව භික්ෂුන්වහන්සේ හැසිරවීම සුදුසු නොවේ. මේ බව ඊනියා විද්වතුන්ගේ ක්‍රියාකලාපයෙන් ද හෙළිවෙයි. ඔවුන් විරුද්ධවන්නේ ජාතිකත්වයේ භික්ෂුන්වහන්සේ රජුන්ට උපදෙස් දීම පිළිබඳ ව ය. ඔවුන් ඊනියා පර්යේෂණ පත්‍රිකා ලියන්නේ ඒ ගැන ය. මේ කිසිවකුවත් සමිත හිමියන්ගේ සෘජු දේශපාලනය විවේචනය කරනු මා දැක හෝ අසා හෝ නැත.

© Prof. Nalin De Silva

ඉල්ලුම සැපයුම දේශපාලනයට අවශ්‍ය හාමුදුරුවන් ඉදිරියට දමා තමන් අවසානයේ දී කිනම් ක්‍රමයකින් හෝ පාර්ලිමේන්තුවට යැම විය හැකි ය. මෙය කේවල් කිරීමක් ද විය හැකි ය. කෙසේ වෙතත් මෙහි තර්ජනයක් ද වෙයි. 1994 පමණ සිට ගොඩනගාගත් දෙයක් ජාතික ව්‍යාපාරයට වෙයි. එය හෙමින් වර්ධනය වෙයි. සෝම හාමුදුරුවන්ගේ අපවත්වීමට පැමිණි සෙනග උන්වහන්සේ ඉදිරිපත් වුව ද ඡන්දය දෙනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකි ය. මෙරට ජාතිකත්වයට එරෙහි වූ ක්‍රිස්තියානි යටත්විජිතවාදයට භික්ෂූන්වහන්සේ පරදිනු දැකීමට අවශ්‍ය ඇත. ඡන්දයෙන් හාමුදුරුවන් පරාජය වීම විවරණය කෙරෙනු ඇත්තේ ජනතාව භික්ෂූන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීමක් ලෙස ය. 1994ට වඩා 2004 බල තුලනය වෙනස් ය. අද කළ යුත්තේ සන්ධානය තුළ ජාතිකත්වයේ බලය තහවුරු කිරීම මිස බලයට පත්වීම සඳහා ඊනියා කෙටි මාවත් සෙවීම නොවේ. ඊනියා කෙටි මාවත් කාගේ වුවමනාවට යොදා ගත්ත ද ඉන් ජාතික ව්‍යාපාරයට වන්නේ අවැඩක් ම පමණකි.

© Prof. Nalin De Silva